## අලයෝ

අලයෝ කිව්වම මතක් වෙන්නෙ වැලිමඩ අල ගොවියන්ව. කැම්පස් වල ඉන්න එක ජාතියක ශිෂ්‍ය කොට්ඨාශයකුත් මේ නමින්ම හැඳින්වෙනවා. අල ගොවියෝ නම් ඉතින් අල වවලා ඒකෙන්ම ජීවත් වෙන නිසා අලයෝ කිව්වට අවුලක් නැහැ. කැම්පස් වල ඉන්න සෙට් එකට අලයෝ කියන්නේ මොකද කියලා හුග දෙනෙක් නම් දන්නවා. කිසිම දේකට මැදිහත්වීමක් නැති, කරන එවුන්ටත් මොනයම්ම ආකාරයක හරි උදව්වක් නැති, කරගෙන යන වැඩක් වුණත් දිය කරලා දාන්න හදන අමුතුම කට්ටියක් තමයි අලයෝ කියන්නෙ. කොටින්ම කිව්වොත් හැම දේම අල කරලා දාන උන්. හැබැයි උන් මොළේ නැති උන් නම් නෙවෙයි.

මේ අලයෝ කියන වචනෙත් සමාජගත උනේ කැම්පස් එකෙන්ම තමයි. එහේ කට්ටිය අලුත් වචන සමාජගත කරන්න ඒ කාලේ ඉඳලාම දක්ෂයෝ. ඉතින් මම මේ කියන්න හදන්නේ එහෙම අලයෝ සෙට් එකක් මෙල්බන් වලත් ඉන්නවා කියන එකයි. මේ කට්ටිය කවුරු හරි අමාරුවෙන් ප්ලෑන්



කරලා මොනවා කරන්න හැදුවත් මොකක් හරි කරලා ඒක නොකෙරෙන තැනට වැඩ කරනව කියලා තමයි ආරංචිය. කොටින්ම කිව්වොත් මේ යාලු මිත්‍රයෝ එකතුවෙලා අහිංසක සතුටක් ගන්න කරන සර්ප්‍රයිස් පාටි තියෙනවානේ. ඔය එක එක්කෙනාගේ උපන්දින වලට. අනේ ඉතින් කට්ටිය සෑහෙන මහන්සියක් වෙලා රහස්‍යභාවයත් රැකගෙන හැම දේම සෙට් කළාට පස්සෙ මේ අලයෝ කරන්නෙ හෙමින් සැරේ අර උපන්දිනය අයිති මිනිහට කෝල් එකක් දීලා වැඩේ අල කරලාම දාන එක යි.

"අද හවස ඔයාගෙ බර්ත්ඩේ පාටියලු නේද?"

ඒ වගේ ප්‍රාථමික මට්ටමේ වැඩ වල ඉඳලා පොදු සමාජ කටයුතු දක්වාම මේ සෙට් එකේ වැඩ විහිදිලා තියෙනවා. කිසිම දේකට එන්නෙත් නැහැ. කරන එවුන්ට කරන්න දෙන්නෙත් නැහැ. මාර හුරතල් වැඩ කර කර සුද්දෝ වගේ ජීවත් වෙනවා.

කැම්පස් නම් මෙහෙම අලයොන්ට වට පෝරියල් දෙනවා මදි නොකියන්න. ඒත් ඉතින් මෙහේ කොහෝද? මේක ප්‍රජාතන්ත්‍රවාදී රටක්නෙ. වැඩ්ඩොන්ටයි අලයොන්ටයි සේරටම එක පෙළට ඉන්න වෙලානෙ තියෙන්නෙ. ෂිහ් අම්මපා..

## අපේ කොටස

ඔස්ට්‍රේලියාව ඇතුළෙ මොකක්ම හරි අවුලක් ඇති කරන්න ත්‍රස්තයෝ දැන් කාලෙක ඉඳලා වලි කනවා. ඒත් ඉතින් සාමකාමී මිනිස්සුන්ගෙ වාසනාවට තවම කිසිම දෙයක් කරගන්න බැරිවුණා. ඒ පිලිබඳ ගෞරවය ඔස්ට්‍රේලියාවෙ ආරක්ෂක අංශ වෙත පුදකරන්න චූටි මල්ලි දෙවරක් හිතන්නෙ නැහැ. කරුණු හෙළිදරව් නොවුණත් ඔවුන්ට



ඒ කාරිය කරන්න නිහඬව උදව් කරන පිරිසකුත් මේ සමාජයේ ඉන්නවා. ඒ කරුණු කාරනා වල රහස්‍යභාවය රකින්නත් ඔවුන් වග බලාගන්න බව සහතිකයි.

සාමාන්‍ය මගීන් යන ගුවන් යානාවක් බිම හෙළන එක ගැන හිතන්නවත් පුලුවන් උන්මන්තකයෙකුට පමණයි. ඒ උන්මන්තකයන්ගෙ මගුල් වැඩ නිසා කී දෙනෙක් නම් අපහසුවට පත් වෙනවද? අපි මෙහෙ ආවෙ ගිනිගත්ත දේශයක ඉඳලා. ආයෙම මේ දේශයත් ගිනිගත්තොත් ඒක නම් ලොකුම බෙදවාචකයක්. ඒ නිසා අපි හැමෝටම වගකීමක් තියෙනවා මේ රටේ ආරක්ෂාව වෙනුවෙන් උපරිමයෙන් කැපවෙන්න. අපට සටන් කරන්න බැහැ. ඒත් අපට සැක හිතෙන දේ ගැන තොරතුරු ලබා දෙන්න පුලුවන්. මේක ටීම් වර්ක් එකක්. ඔබ ඔබේ කොටස හරියට කළොත් අනෙකා එයාගෙ කොටස හරියට කරයි.

## සටනක සටහනක්

මේ සටහන් පෙළ ලියන්න ගත්තෙ ජූලි මාසෙ. ජූලි මාසෙ කියන්නෙ මුලු රටටත් පෞද්ගලිකව අපටත් අමතක නොවන මතක රැසක් ඉතිරි කර ගිය මාසයක්. මම විතරක් නෙවෙයි.. පොඩි අයියත් කිව්වෙ ජූලි මාසෙ නම් මාර මාසයක් කියලයි. ඉන්දු ලංකා ගිවිසුම අස්සන් කෙරුවට පස්සෙ රට ගිනිගත්ත හැටි මතකයි ඒ ගිනිතිබ්බ තිබිල්ලෙන් රට කොයි තරම් වැටෙන්න ඇද්ද



කියලා දැන් තමයි හිතෙන්නෙ. ඒ කාලෙ පොඩි අයියල ගැම්මට ඒව කළාට දැන් හිතෙන් පසුතැවෙනවා.. කරපු විනාසය ගැන... මොනා කරන්නද? සටනකට බැස්සම හොඳ නරක තේරෙන්නෙ නැහැනෙ. ඒ එදා සටන ගෙනිච්ච හැටි.

ඒත් අද යන සටන් දිහා බැලුවහම පේන්නෙ මේ සටන් උපක්‍රම වෙනස් කරන්න කාලය ඇවිත් කියන එකයි. සටනක් ඇතුලෙ ඉන්න අයට පේන විදිහයි පිටින් ඉන්න අයට පේන විදිහයි දෙකක් කියන එක මේ සටන් මෙහෙයවන අයට නොතේරෙන්නෙ නොමේරපු කමටම තමයි. ඇහුම්කන් නොදෙන කමටයි..

මේ විදිහට ගියොත් තව ඉස්සරහට කිසිම සටනකට මිනිස්සු ගෙන්න ගන්න ැරිවේවි. ඒ තත්වයෙදිම තද අරටු පවා බිඳ වැටෙන හැටි බලා ඉන්න දුකයි. මේ විදිහට ගියොත් ප්‍රශ්න පුරුදු විදිහටම පෙරලි පෙරලි ඉදිරියට යාවි. අරටු ටික දියවෙනකං ඔහොම යාවි. මාරම දුකයි..

## මාලිමා සංසදය - මග පෙන්වන්නට

ලෝකෙ බොහොමයක් මිනිස්සු තමන්ගෙ රස්සාවල් කරගෙන දරුමල්ලො රැකබලාගෙන තමාගේම කියලා ලෝක හදාගෙන මම මගේ මට කිය කිය ජීවත් වෙද්දි තවත් කොටසක් ලොකෙ අනිත්



මිනිස්සු ගැන හිතමින් වැඩ කරනවා. මට නොව අපට කියලා හිතලා වැඩ කරනවා. අපේ සමාජය ගත්තම ඉතිහාසේ ඈත අතීතේ ඉඳන් පැවත එන ක්‍රමයක්. දැන් අභාවයට යමින් තියෙනවා කියලා චූටි මල්ලිට හිතෙන ක්‍රමයක්.



බොහෝ වේලාවට මිනිස්සු එකට ඉන්නේ ප්‍රශ්න විසඳගන්න අමාරු වුණාම. ප්‍රශ්න අඩුවෙන කොට මිනිස්සු ආත්මාර්ථකාමී වෙනවා. විශේෂයෙන් මේ වගේ රටවලදි අපට ඒක දැකගන්න පුලුවන්. ඔස්ට්‍රේලියාවට සංක්‍රමණය වුණ මුල් දශකය තුළ මිනිසුන්ගේ තිබෙන එකමුතුව සුහදත්වය අද තියෙනවා. දැන් වෙනකොට බොහෝ දෙනෙකුගේ ප්‍රශ්න විසඳිලා නිදහසේ ඉන්න කාලය. මේ යන්නේ දෙවන පරම්පරාවේ කාලය. ඒ අතරේ මෙහෙම අහන්න හිතෙනවා. මිනිස්සු තමනගේ නිදහස පොදු කටයුතු සඳහා යොදවන්න සූදානම්ද? නැහැනෙ.. දැන්ප දැන් ජාති අනුව ආගම් අනුව පාසල් අනුව විශ්ව විද්‍යාල අනුව කණ්ඩායම් බෙදිලා. පොදු කටයුතු කරන්නෙත් බෙදිලා තරගෙට.

එහෙම කාලෙක තමයි මාලිමා සංසදය කියන සංවිධානය බිහිවෙන්නෙ. පහුගිය කාලය පුරාම ඔවුන්ගෙ වැඩ ගැන චූටි මල්ලි බලාගෙන හිටියෙ. ඔවුන්ගෙ වැඩ ඇතුළෙ පක්ෂ ජාති ආගම් පාසල් බේද තිබුණෙ නැහැ. ඔවුන්ගෙ බොහෝ කටයුතු වලට සිංහල ද්‍රවිඩ මුස්ලිම් විතරක් නෙවෙයි වෙනත් ජාතීන්ට අයත් පිරිස සම්බන්ධවෙලා හිටියා. ඔවුන් පසුගියදා පැවැත්වූ ලංකාවේ ගං වතුරින් පීඩාවට පත් ජනයාට උදව් කිරීමට මුදල් සොයාගැනීමේ රාත්‍රී භෝජන සංග්‍රහය නම් පංකාදු පහයි. එයට සහභාගි වී සිටි විවිධ ජාතීන් දුටු විට සිතුණේ මාලිමා සංසදය කොයි තරම් පොදු ජනතාව අතරට ගොස් ඇද්ද කියලයි. බොහෝ දෙනා මෙවැනි සමාජ මෙහෙවර කිරීමට දෙවරක් හිතන මොහොතක (කෙළවරක් නැති සන්දර්ශන සහ උත්සව නිසා) නොබියව සංවිධානය කර එය සාර්ථක කරගත් මාලිමා සංසදය කරන හිතවතුන්ට අපේ ආදරය සහ ගෞරවයත් පුදකරන්න කැමතියි. ඉදිරියේදී තවත් මෙවැනි කටයුතු කරන්න. ඔබ නොදැක්කට අපි විශාල ආශ්වාදයකින් ඔබ දිහා බලා ඉන්නවා.

## නීතිය හා සම්ප්‍රදාය

නීතිය හා සම්ප්‍රදාය කියන්නෙ හැම විටම එකට බැඳිලා තියෙන දෙයක්නෙ. ඒක නිකං ගහට පොත්ත වගේ. ඒ නිසා තමයි ඕස්ට්‍රේලියාව වගේ රටවල යහපත් සමාජ ක්‍රමයක් ගොඩනගා ගන්න හැකි වෙලා තියෙන්නෙ. මිනිස්සු නීතිය රකිනවා. සම්ප්‍රදායට ගරුකරනවා. සමහර වෙලාවකට නීතියෙන් ලැබෙන දඬුවමකට වඩා සම්ප්‍රදාය කඩකිරීමෙන් ලැබෙන අපවාදය බලවත් වෙනවා. විශේෂයෙන් දේශපාලනයෙදි මේ දෙකම ආරක්ෂා කරගෙන කටයුතු කරන්න දේශපාලනඥයන් පරිස්සම් වෙනවා. මොකද මේ දෙකෙන්ම රිංගලා යන්න මෙහේ කට්ටියට ඉඩක් නැහැ. නිදහස් මාධ්‍ය නිසා. ඒ නිසා දේශපාලන




ක්ෂේත්‍රයට හොරු දූෂිතයන් එනවා අඩුයි. එනව නම් එන්න වෙන්නෙ විෂය ගැන දැනුම සහ කැපවීම සමගම තමයි. ඒත් අර අවාරෙට එන මොකක්ද එක වගේ පෝලින් ලත් නැත්තෙම නැහැ. මෙහෙව් රටේ ද්විත්ව පුරවැසිභාවයත් එක්ක දේශපාලනය කරපු කීපදෙනෙක්ම පසුගිය දවස් වල කොටු වුණා. මාර වැඩේ කියන්නෙ මේගොල්ලෝ කොහොමද එහෙම කළේ කියන එකයි. වංක බව වංචාව කෙසේ වෙතත් ඔවුන් මෙපමණ කල් තනතුරක් දරා හිටියා කියන්නෙම මේ සිස්ටම් එක ඇතුලෙත් අවුල් නැත්තෙම නැහැ කියන එකනෙ. පහුවෙලා හරි බඩු මාට්ටුවුණ එක හොඳයි. මොකද මේ රිංගන හිල් වහලා දාන්න දැන් පුලුවන්නෙ. කොහොම වුණත් ගත්ත පඩි නඩි ආපහු ගෙවන්න වෙන එක නම් ලොකු දෙයක්. මෙහෙත් අර ලංකාවේ වගේ මාසෙට ඩොලර් 50 ගානේ ගෙවන්න හැකියාවක් තියෙනවද දන්නෙ නැහැ. එහෙම උණොත් නම් අවුල්. මොකද මේ ගොල්ලෝ නීතිය ගැන නොදැන නෙවෙයිනෙ මේ දේ කරල තියෙන්නෙ.

මට මතක්වෙන්නේ මේ වැරැද්දම කරලා අහුවෙලා වැරදිකාරිය වෙලත් තාමත් ලංකාවෙ පාර්ලිමේන්තුවේ පඩි ගන්න අපේ ගීතා නැන්දා ව. ඒ අතින්න නං ලංකාවේ අධිකරණය ෂෝක්. ඒක රබර් වගේ වෙලාවෙන් වෙලාවට එහෙට මෙහෙට නවන්න පුලුවන් එකක්නෙ.

**චූටි මල්ලි**